**මුදල් මණ්ඩලය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

| **2020 නොවැම්බර් 27** | **චක්‍රලේඛය** | **2020 අංක 12** |
|---|---|---|

# කොවිඩ්-19 නිසා බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා ණය සහන කාලයක් ලබාදීම සඳහා නිකුත් කළ 2020 අංක 11 දරන චක්‍රලේඛය සඳහා වන සංශෝධන

කොවිඩ්-19 නිසා බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා ණය සහන කාලයක් ලබාදීම සඳහා නිකුත් කළ 2020 අංක 11 දරන චක්‍රලේඛය සඳහා පහත සංශෝධනයන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබයි.

2020 අංක 11 දරන චක්‍රලේඛයේ 2 වන පරිච්ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබයි.

**2. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය :**

2.1. සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන්ට ණය සහන ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත් භාර දීමේ අවසන් දිනය 2020 දෙසැම්බර් මස 10 දක්වා දීර්ඝ කරන ලදී. බැංකු නොවන මූල්‍ය ආයතනයේ අවසන් තීරණය (ණය සහන ලබා දීම/ ප්‍රතික්ෂේප කිරීම) ඉල්ලුම්පත් භාර දී දින 45 ක් තුළ ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැනුම් දිය යුතුය. මෙම පරිච්ඡේදයේ අනෙකුත් වගන්ති නොවෙනස්ව පවතී.

2.1 ඡේදය අවසන් වීමෙන් පසු පහත වගන්තිය 2 වන පරිච්ඡේදයට එකතු කරන ලදී.

2.2. සහන ලබා දීමට අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය සැකසීම සහ ඒ සම්බන්ධයෙන් ශාඛා මට්ටමේ කාර්යය මණ්ඩලයට උපදෙස් ලබා දීම සියලුම ප්‍රධාන විධායක නිලධාරීන්ගේ සහ අනුකූලතා නිලධාරීන්ගේ වගකීම වේ.

**මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්**
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති